ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

<u>ඉන්දිය ප්‍රදාන සමඟින් කෑගල්ල සහ කළුතර දිස්ත්‍රික්කවල ඉදිකළ ආදර්ශ ගම්මාන ප්‍රතිලාභීන්ට භාර දේ</u>

2026 ජූලි 29 වන දින ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා සහ නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය ගරු වෛද්‍ය සුසිල් රණසිංහ මැතිතුමා විසින් කෑගල්ල දිස්ත්‍රික්කයේ 'නන්දාගම' සහ කළුතර දිස්ත්‍රික්කයේ 'ජන අරුණ ගම' යන ආදර්ශ ගම්මාන විවෘත කරන ලදි. පරිසර අමාත්‍ය ගරු වෛද්‍ය ධම්මික පටබැඳි මැතිතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ විවෘත කිරීමේ උත්සවය සඳහා ද සෞඛ්‍ය සහ ජන මාධ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමා කළුතර දිස්ත්‍රික්කයේ විවෘත කිරීමේ උත්සවය සඳහා ද සහභාගී වූහ.

2. මේ අනුව, ගම්මාන දෙකෙහි ඉදි කළ නිවාස 48 ප්‍රතිලාභීන් වෙත භාර දෙන ලදි. දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ එම දිස්ත්‍රික්ක පරිපාලනයේ නිලධාරීන් ඇතුළු රැසක් මෙම උත්සව සඳහා සහභාගී වූහ.

3. ඉන්දියානු රජයේ ප්‍රදාන සමඟින් ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25ම ආවරණය කරමින් ක්‍රියාත්මක කෙරේ. මේ සම්බන්ධයෙන් ඉන්දියානු රජය සහ ශ්‍රී ලංකා රජය අතර අවබෝධතා ගිවිසුම 2017 ඔක්තෝබර් මාසයේදී අත්සන් තබන ලදි.

4. දිස්ත්‍රික් නිවාස කමිටු විසින් තෝරා ගන්නා අඩු ආදායම්ලාභී පවුල් සඳහා එක් ගම්මානයක නිවාස 24 බැගින් නිවාස 600ක් මෙම ව්‍යාපෘතිය යටතේ ඉදි කෙරේ.

5. මේ වන විට දිස්ත්‍රික්ක 18ක එනම් මඩකලපුව, වවුනියාව, යාපනය, මහනුවර, ගම්පහ, අනුරාධපුර, බදුල්ල, මාතලේ, පුත්තලම, කොළඹ, ත්‍රිකුණාමලය, මොණරාගල, කිලිනොච්චි, මන්නාරම, මුලතිව්, රත්නපුර, අම්පාර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ආදර්ශ ගම්මාන ඉදි කර ඇත. සමස්තයක් වශයෙන් ව්‍යාපෘතියේ කටයුතු 98.5%ක් අවසන් වී ඇති අතර ඉතිරි ගම්මාන ද නුදුරේදීම ප්‍රතිලාභීන්ට භාර දීමට අපේක්ෂිතය.

***

කොළඹ

*2026 ජූලි 29*